දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 පුනර් පරීක්ෂණය - 2019 දෙසැම්බර්/2020 ජනවාරි

Bachelor of Arts General (External) Degree Part II Repeat Examination 2015 – Dec. 2019/Janu. 2020

# සිංසා 3.1 - සම්භාව්‍ය සිංහල ගද්‍ය කාව්‍යය

# SLG 3.1 - Classical Sinhala Prose

කාලය පැය තුන යි

**පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

**නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය**

---

01. i. පහත දැක්වෙන ඡේද වත්මන් සිංහලයට නඟන්න.

ii. ඉරි ඇඳි පදවලට විවරණ සපයන්න.

(අ) හො පුන පුනා බලන්නී හැඳිනැ අතින් ලෙහි පැහැරැ හඬා පාමුලැ හී "හිමි තොපට මෙවෙනි සිතක් ඇති බැවින් මා මහත් යශසින් පිරිහෙළා අනාථ කුමට කළාව?" යි නොඑක් සෙ වැහැසැ ඇසැ කඳුළු පිසැ පියා නැඟී, අතින් පය ගෙනැ, ඇතුළු ගෙයි වඩා හිඳුවා බත් දුන. වළඳා හිඳැ දිට්ඨමංගලිකාව, නො සොස්, නො වහස, මම් තී පා දෙවි දිය මුළු දඹදිවැ රජනට <u>අභිෂේකොදක</u> කරන්නට පොහොසත්මි. තො මා කීවා කර, නුවර වැදැ "ම- සැමි සැඬලෙක් නොවෙයි. මහබඹහ හි හඬ ගසා ඇවිද" යි කීහැ. හො "මම් මාගෙ මුවදොසින් මැ දුක්පත් වීමි. එසෙ කියන්නට නොනිස්සෙමි" යි කිවැ. ඔහු මම ගිහි මිනිස් කලැ දූ බොරු නො කීයෙමි. දැන් පැවිජ්වැ කුමට කියම් ද අද පුර අටවකැ, තො අන් සත්දවසෙකින් පනුරැසි පොහොදවස් ම-සැමි මහබඹ සඳමඬල බිඳ පියා මා කරා එයි. මුළු නුවරැ හඬ ගහා යි කියා නැඟී ගියො. හො හදහා සූර වැ සතුටුවැ සවසැ හා රැයිම්මෙ නුවර වැදැ කී පරිද්දෙන් හඬ ගහයි.

(අමාවතුර, ගහපති දමනය, (සංස්) කෝදාගොඩ ඤාණාලෝක හිමි.)

(ආ) ආළවකයා නැවැතැ මෙ මහණු වතුරින් යවාපියමි මහ වැස්සක් වැස්වීයැ. අහස්හි සියදහස් වලාකුළු නඟා ගෙනැ වැසි නැඟීයැ. එ වැස්සෙහි මහාධාරා වූ නියා වට තල්කඳ පමණ ධාරා පොද වී යැ. එ වැස්සෙහි ධාරායෙහි පමණ කවරෙක් නම් කියා නිමවා ද එ වැසි වතුරෙහි මහත් දාගැබ් සා බුබුළු වියැ. සැට යොදුන් කෙලෙස්කුළු සා පෙණපිඬු වියැ. නික්මුණු වතුරු යොදුන් ගණන් පමණ මහ ගල් කුළු නොපැකිලැ උදුරා ගෙන යෙයි. අහසැ නොයෙක් තැනැ බොකු හීපියා තිබෙන දෙව්දුනු දහස් ගණනැ. නොයෙක් දිශාවෙහි පහරන විදුලිය සියදහස් ගණනැ. එ වැසිපවනින් ඉදිරි නැඟි ගල්කුළු දහස් ගණන් අහසැ වැසිකුළු දියුණු කෙරෙමින් බමමින් සිටියෙයැ. මෙසෙ දිවන මහ වතුරු <u>පොකුරුවැස්සක්</u> සෙ පෙරෙවැ වැඩ හුන් සිවුරෙහි හූ අගකුත් තෙමා ගත නො හිණ. නැවැතැ අඟුරු වැස්සක් වැස්වී යැ. මහත් වූ රක්ගල් එ අඟුරු වැස්සෙහි පුපුරු සා ඇතැ යි යන පරිද්දෙන් මහත් අඟුරු වැසැ බුදුන් කරා බස්සී. මාරයා මැවූ මහ ගින්නට පවා ශ්‍රී පාදය දික් කළ විගස මැ එ ශ්‍රී පාදය පිළිගෙනැ මහපියුමෙක් නැංගැ.

(බුත්සරණ, ආළවක දමනය, (සංස්) ලබුගම ලංකානන්ද හිමි)

(ඇ) දූන් ළඟට ගොසින් වැඳ ගන්ට පයත් අවසඟ ය. වැඳහෙවත් අත ඔසවා නළල තබා වඳින්ට අතත් නො නැමෙයි. අනික් කළ මනා දෙයකුත් නො පෙනෙයි. සිත පහදවා ගැන්මෙහි අදහස් ලැබෙන බැවින් ආයාස නැත. මේ අවස්ථාවට පිළිවන් ව තිබෙන සිත පැහැදීම ම කෙරෙමි යි සිතා පිළියමට දෛව නැතත් බුදුන් දකින්ට දෛව ඇති බැවින් දැක සිත පහදවා බුදුන් වැඩි ගමන සාර්ථක කළහ. බුදුහු ත් බර එසවිය නොහෙන්නවුන්ට ශරීර භාරය ම සැහෙන්නා සේ මෝහට මෙ විතරෙක් ම සෑහෙයි - සිතා වදාරා ලා ශරීර ගත වූ පාණ්ඩු රෝගයට පිළියම් නො ලැබ මියන මට්ටකුණ්ඩලීන්ට පරලොව දී කායපීඩා නැමැති රෝග හට නොගන්ට චිත්ත ප්‍රසාද නැමැති පිළියම් කරවා වැඩිසේක. බුදුරජුන් වහන්සේ නො පෙනෙන තැනට වැඩ පියන්නා ම පහන් සිත පසු නො බස්වා හොත් තැනැත්තෝ මිය නිදා පුබුත් කෙණකුන් පරිද්දෙන් දුක් මුහුද සියල් ලෙසින් ගෙවන්නට නුවුව ත් එක් ලෙසකින් ගෙවා තව්තිසා දෙව් ලොව එක්සිය විසි ගවුවක් උස ඇති රන් විමනෙක දිව්‍ය පුත්‍ර ව උපන්හ.

(සද්ධර්මරත්නාවලිය, මට්ටකුණ්ඩලී වස්තුව, (සංස්.) කිරිඇල්ලේ ඤාණවිමල හිමි)

(ඈ) එකල්හි සර්වඥයන් වහන්සේ ප්‍රමාණාතික්‍රාන්ත වූ කාලයෙහි අතරක් නැති කොට පවත්වන ලද වාග් සුචරිතානුභාවයෙන් දිව සුවඳින් සුවඳ කැවූ නොයෙක් සුවඳින් පිරුණු රුවන් කරඬුවක් හරන කලක් පරිද්දෙන් මුඛ පද්මය විවෘත කොට මධුර ස්වර විහිදුවමින් "සැබෑ ද උපාසකවරුනි, තෙපි රත්නත්‍රයෙහි සරණ හැර අන්‍ය තීර්ථකයන්ගේ සරණ ගියාහුද'යි විචාරා වදාළ සේක. එකල්හි තමන් කළ කාරිය සඟවන්නට අසමර්ථ වූ ඔවුන් විසින් "සැබව ස්වාමීනි" යි කී කල්හි බුදුහු උපාසකවරුන්ට ආමන්ත්‍රණය කොට "එම්බා උපාසකවරිනි යටින් අවීචිය හා මත්තෙන් භවාග්‍රය කෙළවර කොට සරසින් අනන්තාපරිමාණ සක්වළෙහි සීල සමාධි ප්‍රඥාදී වූ ගුණයෙන් බුදුන් හා සම කෙනෙක් නැත. බුදුන්ට වටනා කෙනෙක් කැල ම නැත. මෙසේ උත්තම ගුණයෙන් සමන්විත වූ රත්නත්‍රය සරණ ගිය උපාසක කෙනෙක් වේව යි උපාසිකා කෙනෙක් වේව යි නරකාදී වූ සතර අපායෙහි උපදිනාහු නොවෙති. අපයෝත්පත්තියෙන් මිදී දිව්‍ය ලෝකයෙහි ඉපද මහ සම්පත් අනුභව කෙරෙති."

(පන්සිය පනස් ජාතක පොත, අපණ්ණක ජාතකය, (සංස්.) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.)

(ලකුණු 28 යි)

02. චරිත හා අවස්ථා නිරූපණයෙහි ලා ගුරුළුගෝමීන්ගේ සමත්කම් අමාවතුරෙහි නියමිත කථා වස්තු ඇසුරෙන් පහදන්න.

03. බුත්සරණ ගද්‍ය රචනා රීතියෙහි දැකිය හැකි සුවිශේෂතා කවරේ ද යි සනිදර්ශන ව පැහැදිලි කරන්න.

04. "ගැඹුරු දහම් කරුණු සරල වූ ද, උපමායෙන් විචිත්‍ර වූ ද ගැමි බස් වහරකින් වටහා දීම ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලියෙහි ප්‍රකට ලක්ෂණය යි." සාකච්ඡා කරන්න.

05. පන්සිය පනස් ජාතක පොතෙහි එන කථා දේශීය ජන සංස්කෘතියේ පෝෂණයට බල පෑ අයුරු නියමිත ජාතක කථා ඇසුරු කර ගනිමින් විමසා බලන්න.

06. පොළොන්නරු හා දඹදෙණි අවධිවල රචිත ගද්‍ය ග්‍රන්ථවල දැකිය හැකි සමාජීය හා සංස්කෘතිකමය සන්නිවේදන ලක්ෂණ ඔබට අභිමත ග්‍රන්ථ ඇසුරෙන් විචාරාත්මක ව පහදන්න.

(02 සිට 06 දක්වා ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)

**********************************************